**කොවිඩ්-19 මැඩපැවැත්වීම සඳහා රාජ්‍යයන් විසින් ක්‍රියාමාර්ග ගැනීමේදී ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ විෂමතාවයන් සැලකිල්ලට ගත යුතුය .**

*අන්තර්ජාතික නීතිවේදීන්ගේ කොමිසමේ, කාන්තාවන් උදෙසා යුක්තියට ප්‍රවේශය ලබා දීම උදෙසා වන කණ්ඩාම විසිනි .*

කොවිඩ්-19 වසංගතය ලොව පුරා ව්‍යාප්ත වීමත් සමග, බොහෝ රජයන් විසින් නව කොරෝන වෛරසය මැඩලීම සඳහා ගමන් තහනම්, නගර වසා දැමීම් හෙවත් ලොක් ඩවුන් කිරීම් , ඇඳිරිනීතිය පැනවීම, සහ පාසල්, කාර්යාල සහ දේශසීමා වසා දැමීම් ආදී වපසරියක විහිදුනු විවිධ වැඩපිළිවෙලවල් හඳුන්වා දෙමින් සිටී. රජයන් සිය ජනතාවගේ ජීවත් වීමේ අයිතිය සහ සෞඛ්‍ය සඳහා ඇති අයිතිය සුරක්ෂිත කිරීම සඳහා ඔවුන් සතු වගකීම ඉටු කරමින් තීරණාත්මක පියවර ගැනීම වනවා සේම එකී ක්‍රියාමාර්ග, වෛරසය නිසා දැනටමත් ජනතාවට මුහුණ පෑමට සිදු වී ඇති ආපදාවන්ට අමතරව තවත් ගැටළු ඇතිකරන්නාවූ ක්‍රියාමාර්ග බවට පත් නොවන, මානව හිමිකම් වලට අනුගත, ක්‍රියාමාර්ග වීමද එක හා සමානවම වැදගත් වේ. සමානාත්මතාවය ගරු කරමින් කිසිදු ආකාරයේ වෙනස් කොට සැලකීමක් සිදු වන්නට ඉඩ නොදෙමින් කටයුතු කිරීම, එසේ මානව හිමිකම් වලට අනුගතව, ක්‍රියාමාර්ග ගැනීමේදී වැදගත්වන එක් ප්‍රධානතම කරුණක් වේ . ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ඇතිවන බලපෑම සැලකිල්ලට ගැනීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූලවන ප්‍රතිචාරයන් දැක්වීම යන කරුණු ඉහත දැක්වූ මානව හිමිකම් ආරක්ෂා කිරීමේ මූලධර්ම අනුගමනය කිරීමේදී වැදගත්වේ .

කෙසේවෙතත් , මේ වන විට ලොව පුරා විවිධ රජයන් විසින් වෛරසය මැඩලීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කිහිපයක්ම පෙර - සිටම පැවති ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අසාධාරණකම් තවදුරටත් උත්සන්න කිරීමට දායක වනු ඇති අතර එමගින් කාන්තවන්ගේ සමාජ ආර්ථික අයිතීන් අසාධාරණ ලෙස අයහපත් බලපෑම්වලට ලක්වේ . බොහොමයක් ආබාධිත, සරණාගත, සංක්‍රමික, රඳවා සිටින, දුගී බවින් පීඩා විඳින සහ / හෝ සුළු ජාතියකට, සුළුතර ජනවර්ගයකට, සුළුතර ආගමික කොට්ඨාශයකට හෝ සුළුතර ලිංගිකත්වය අනුව වෙනස්වන කණ්ඩායමකට හෝ අයත් වන කාන්තාවන් මෙවන් ආපදා තත්වයකදී එකිනෙකට සම්බන්ධවුනාවූ විවිධ ආකාරයේ පහත්කොට/ වෙනස්කොට සැලකීම් වලට ලක්වීමට බොහෝ දුරට ඉඩ ප්‍රස්තාව ඇත .

**# නිවසේ සිටීම (#*StayHome*) කාන්තාවනට දැනෙන්නේ කෙසේද?**

ලෝකයේ බොහෝ රටවල කොවිඩ්-19 වසංගතය පාලනය කිරීම සඳහා ලොක් ඩවුන් කිරීම, නිරෝධායනය සහ පාසල් වසා දැමීම යන ක්‍රියාමාර්ග ගැනීම ඔස්සේ කාන්තාවන් මත අවකල්‍ය බලපෑමක් හෙවත් වෙනස්කොට සැලෙකෙන ආකාරයේ බලපෑමක් ඇති වී ඇත. කාන්තාවන් සහ ගැහැණු දරුවන් පවුල තුල රැකවරණය ලබා දීම පිලිබඳ භූමිකාවන් කරගෙන යනු ඇති යන අපේක්ෂාව හේතුවෙන් ඔවුන් හට ආර්ථික හා රැකියා අවස්තා හිමි වීම අවම වන අතර එමගින් සංවර්ධනය සඳහා වන ඔවුන් සතු අයිතිය අහිමි කිරීම සිදු වේ. මෙම තත්වය වඩාත් දරුණු වන්නේ ඔවුන් හට තමන් අපයෝජනයට ලක් කරන සහකරුවෙකු සමග නිරෝධායනය වීමට සිදුවන අවස්ත්වාලදීය. එවන් තත්වයකදී කාන්තාවන් දරුණු ලෙස හා නිරත්තරයෙන් සමීප සහකරුවන්ගේ හිංසනයට ලක්වීමට ඇති ඉඩ ප්‍රස්ථාව ඉතාම විශාල වේ. අවාසනාවන්ත ලෙස බොහෝ තැන්හි පොලිසිය, වෛද්‍ය සේවාවන්, මානසික සහය හෝ වසංගත තත්වය තුලදී ගෘහස්ත හිංසනයට ලක්වන කාන්තාවන්ට සරණ වන නිවාස / මධ්‍යස්ථාන ආදිය සමග සම්බන්ධ වීමට හෝ ඒවා සොයා ගැනීම සඳහා වන මාර්ගෝපදේශනය සහ තොරතුරු වල කැපී පෙනෙන හිඟයක් දක්නට ඇත. උදාහරණයක් ලෙස එක්සත් රාජධානියේ ගෘහස්ත හිංසනයට ලක්වන කාන්තාවන් උදෙසා සහන සලසන සංවිධාන 25ක් විසින් කොවිඩ් 19 වසංගත තත්වය තුල ඔවුන් වෙත වාර්තා වූ ගෘහස්ත හිංසන පිලිබඳ පැමිණිලි වල වැඩිවීමක් වාර්තා කල අතර එවැනි සංවිධාන අතරින් හතරෙන් එකක් වාර්තා කලේ තාක්ෂණික ගැටළු , වින්දිතයන් හමුවීමට නොහැකි වීම සහ කාර්යමණ්ඩලයේ අසනීප තත්ත්ව හේතුකොට ගෙන ඔවුන්හට වඩාත් ඵලදායී ලෙස වින්දිතයන් හට උපකාර කිරීමට නොහැකිවූ බවයි.

මීට අමතරව, වෛරසය පැතිරීම වැලැක්වීම සඳහා රජය සතු සියලු සම්පත් ඒවායේ උපරිමයෙන් යෙදවීමට සිදුව ඇති තත්වයක් තුල, දැනටමත් බොහෝ සමාජ පද්ධතීන් තුල විවිධ නීති සහ සම්ප්‍රදායන් ඔස්සේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවාවන් සඳහා තහනම් පැනවී ඇති, කාන්තාවන් හට අංගසම්පූර්ණ වූ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවා පද්ධතියකට ප්‍රවේශය ලබා දීම, අත්‍යවශ්‍ය හා ප්‍රමුඛතාවය ලබා දිය යුතු කාරණයක් ලෙස රජය විසින් නොසලකන්නට ඇත . එහි ප්‍රතිපලයක් ලෙස ඔසප් සෞඛ්‍ය, මාතෘ සෞඛ්‍ය සහ ආරක්ෂිත ගබ්සා කිරීම් පිලිබඳව වන කාන්තාවන් සතු අයිතීන් බරපතල හා කැපීපෙනෙන ලෙස සීමා වී ඇත .

***රැකියාවේ නියුතු කාන්තාවන්***

ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව, වසංගතය මැඩලීමට සටන් වදිමින් ඉදිරිපෙළ සේවයේ නියුතු අවදාමට ලක්ව ඇති සේවා අංශයන්හි හෝ වෘත්තීන්හි කාන්තා නියෝජනය සාපේක්ෂව ඉතා ඉහල මට්ටමක පවතී. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දත්ත වලට අනුව ලොව පුරා රැකියාවන්හි නිරත කාන්තාවන්ගෙන් සියයට 58.6 සේවා අංශයේ සේවය කරති . සමාජ ආරක්ෂණය සඳහා කාන්තාවන් සතු ප්‍රවේශය අඩු මට්ටමක පවතින අතර පාසල් සහ රැකවරණ පද්ධතීන් වසාදැමීම හමුවේ, රැකවරණ ආර්ථිකයක සාපේක්ෂව වැඩි වගකීමක් කාන්තාව වෙත පැවරේ . කාන්තා සංක්‍රමණික සේවකයන්ද, කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ පනවා ඇති ගමන් සීමා

කිරීම් හේතුවෙන්, සිය සේවා ස්ථානය පිහිටි රටට යාමටත් පසුව නැවත ඔවුන්ගේ පවුල් වෙත ඒමටත් නොහැකිව, ඉතාම අසරණභාවයට පත්ව ඇත.

**දේශ සීමා මායිම් වල සිටින කාන්තාවන්: සරණාගතයන් සහ සරණාගතභාවය අපේක්ෂාවන් සිටින්නන්**

බොහොමයක් සරණාගත කඳවුරු සහ තාවකාලික නාවතැන් ලෙස සකස්කරගත් ස්ථානයන්හි ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි යටිතල පහසුකම් සහ සේවාවන් වල ඉතාම දරුණු මට්ටමේ හිඟයක් පවතී. මෙම අවස්ථාවේදී වසංගතය හේතුවෙන් අධිකරණ වසා දැමුණහොත් සරනාගතභාවය අපේක්ෂාවෙන් සිටින පිරිස් වලට දීර්ඝ කාලයක් ඔවුන්ගේ ඉල්ලීම ඉදිරිපත් කිරීමට බලා සිටීමට සිදු වන අතර, යම් හෙයකින් ඇතැම්විට නැවත හරවා නොයැවීම පිලිබඳ මුලධර්ම පවා උල්ලංඝනය වන පරිදි ඔවුන් යලිත් සිය මවු රටවලට හරවා යැවුනහොත් වඩාත්ම අවාසනාවන්ත ඉරණමක් ඔවුන් හට අත් වනු ඇත. පුද්ගල ගහනය අධික වූ විස්තාපන මධ්‍යස්ථාන තුල වෛරසය ව්‍යාප්ත වීම සිදු වීම මගින් ව්‍යසනකාරී ප්‍රතිවිපාක ඇති වනු ඇත. එසේම, අධ්‍යනයන්ගෙන් සොයා ගෙන ඇති ආකාරයට , මෙම පසුබිම තුල කාන්තාවන් සහ ගැහැණු දරුවන් හට සිය බහිශ්‍රාවීය අවශ්‍යතාවයන් ඉටු කරගැනීමට වීවෘත ස්ථාන වලට හෝ පොදුවේ භාවිත කරන එනම් හවුල් සනීපාරක්ෂක පහසුකම් වලට ඉතාම අකමැත්තෙන් වුවද යාමට සිදු වීම නිසා බොහෝ අවස්තාවලදී එම කාන්තාවන් සහ ගැහැණු දරුවන් ලිංගික ප්‍රචණ්ඩත්වයට සහ අපයෝජනයට ලක් වේ.

**කොවිඩ් 19 වෛරසය මැඩලීමට රජය විසින් ගන්නා සියලු ක්‍රියාමාර්ග ස්ත්‍රී පුරුෂ සමාජභාවය සැලකිල්ලට ගත යුතුයි.**

ආර්ථික, සමාජීය, සහ සංස්කෘතික අයිතීන් පිලිබඳ ජාත්‍යාන්තර සම්මුතිය යටතේ, සෑම පුද්ගලයෙකු සතුවම සිය ශාරීරික සහ මානසික සෞඛ්‍ය සම්බන්ධයෙන් ලඟා විය හැකි උපරිම මට්ටම අත්විඳීමට ඇති අයිතිය සම්පුර්ණයෙන් ලබා දීමට රාජ්‍යන් වෙත වගකීමක් / කාර්යභාරයක් පැවරී ඇත. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය මගින් ද, කාන්තාවන් හා පුරුෂයන් අතර සමානාත්මතාවය පදනම් කරමින් , පවුල් සංවිධානය ඇතුළු, සෞඛ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය තහවුරු කරමින්, කාන්තාවන්ට එරෙහිව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති වෙනස්කොට සැලකීම් තුරන් කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම / කාර්යභාරය රාජ්‍යන් වෙත පවරා ඇත.

තවද, මෙවන් වසංගත තත්වයන් වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිලිබඳ පැතිකඩයන් / ගතිකතාවය හඳුනා ගැනීමට අසමත්වීම, එකී වසංගත තත්වයට එරෙහිව දක්වන ප්‍රතිචරයන්ගේ ඵලදායීතාවය සීමා කරන අතරම එහි

ප්‍රතිපලයක් ලෙස කාන්තාවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට බාධා එල්ල කරනු ලබයි. කොවිඩ්19 වැනි වසංගතයකට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග ඵලදායී වීමට සහ එකී ක්‍රියාමාර්ග හේතුවෙන් දැනටමත් පවත්නා හෝ අතීතයේ පැවති ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ සෞඛ්‍ය පිලිබඳ අසාධාරණතත්වයන් යලි ඇති නොවීමට සහ / හෝ එම තත්වයන් තව තවත් උත්සන්න වීම වැලක්වීමට නම්, වසංගත තත්වය තුල ගනුලබන සියලු ක්‍රියාමාර්ග වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිලිබඳ සම්මතයන් සහ භූමිකාවන් හඳුනාගෙන අන්තර්ගත කිරීම වැදගත් වේ . එසේම හදිසි සූදානම සහ ප්‍රතිචාර සැලසුම සකස් කිරීමේදී ස්ත්‍රීපුරුෂ සමාජ භූමිකාවන් , වගකීම් , සමාජ සම්මතයන් සහ කාන්තාවන්ට ආවේනික වූ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන එහි අන්තර්ගත ගත කල යුතුය. ලොක් ඩවුන් තත්වයක් තුල ගෘහස්ත හිංසනයේ වින්දිතයන් බවට පත්වන කාන්තාවන් හට ආරක්ෂාවීම සඳහා නව උපක්‍රම හඳුන්වා දීමද රජය සතු වගකීමක් වේ . එසේම රජය විසින් ගෘහස්ත හිංසනය පිලිබඳ වෘතිකයන්ගේ සේවය අත්‍යාවශ්‍ය සේවයක් ලෙස අතර්ගත කල යුතු අතරම මෙවන් කාල සීමාවක් තුල ඉහල යන සේවා ඉල්ලුමට සරිලන පරිදි ගෘහස්ත අපයෝජනයට එරෙහිව කටයුතු කරන සංවිධාන සඳහා අවශ්‍ය හදිසි සම්පත් ලබා දී ඔවුන්ගේඋපරිමයෙන් සහය අවැසි වින්දිතයන් සඳහා සේවා සැපයීමට අවස්ථාව ලබා දිය යුතුය. එසේම, ගෘහස්ත හිංසනය පිලිබඳ පැමිණිලි කිරීම සඳහා කාන්තාවන් ධෛර්යමත් කිරීම සඳහා විකල්ප ක්‍රියාමාර්ගයක් ලෙස කාලනුරූපීව “උත්පන මනෝඋපදේශන” මධ්‍යස්ථාන හෙවත් “pop-up” counseling centers, ඔසුසැල් ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීම පිළිබඳව සලකා බැලිය යුතුය .

වසංගත තත්වය මර්දනය කිරීමට ගනු ලබන සියලු ක්‍රියාමාර්ග ස්ත්‍රීපුරුෂ සමාජභාවයන්ට අනුකූල වන අතරම මානව හිමිකම් ප්‍රමිතීන් වලට දැඩි අනුකූලතාවයක් දක්වන බවට රජයන් විසින් තහවුරු කල යුතුය . රාජ්‍යන් විසින් මහජන සෞඛ්‍ය අර්බුදයකට මුහුණ දීමේදී ඇතැම් මානව අයිතීන් සීමා කිරීම හෝ ඉන්බැහැරව කටයුතු කිරීම සිදු කලද එවැනි සියලු සීමා කිරීම් සෑම අවස්ථාවකදීම නෛතිකභාවය, අවශ්‍යතාවය, සමානුපාතිකත්වය සහ වෙනස්කොට නොසැලකීම, යන මූලධර්මයන්ට යටත් විය යුතුය .

කාන්තාවන් බොහෝවිට, ගෘහ සේවිකාවන් හෝ ස්වයං සේවයේ නියුතු නිවසේ සිට වැඩ කරන සේවකයන්, වැනි වඩාත් අවදානමට ලක්විය හැකි අවිධිමත් සේවාවන්හි නිරත වන බැවින්, වගකිව යුතු බලධාරීන් විසින් රක්ෂණය වී නොමැති සේවකයන් සහ ඔවුන්ගේ පවුල්ද ඇතුලත්ව, සියලුම දෙනා වෙනුවෙන් සාමූහිකව මූල්‍යනය කල සෞඛ්‍ය සේවාවක් සඳහා විශ්වීය ප්‍රවේශය වැඩි දියුණු කලයුතුය . එසේම අසනීප වූ, නිරෝධායනට ලක් කල හෝ දරුවන් , දෙමාපියන් හෝ පවුලේ වෙනත් සාමාජිකයන් රැක බලා ගන්නා අයවලුන් සඳහා ආදායම් සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා සාමූහිකව මූල්‍යනය කල ගෙවීම් සහිත ලෙඩ නිවාඩු , අසනීප අවස්ථාවන්හිදී ලබා දෙන ප්‍රතිලාභ, දෙමාපිය හෝ රැකවරණ නිවාඩු සඳහා ඇති ප්‍රවේශයන් පුළුල් කිරීමද රාජ්‍යයන් විසින් කල යුතු වේ .

තවද, ජාතික මට්ටමින් සිදුකරන කොවිඩ්-19 නිරීක්ෂණ, සූදානම් වීම්, සහ ප්‍රතිචාර සැලසුම්, ආදියෙහි කාන්තා සරණාගතයින්, අභ්‍යන්තරවශයෙන් උන්හිටිතැන් අහිමි වූ කාන්තාවන් සහ සරනාගතභාවය අපේක්ෂාවෙන් සිටින කාන්තාවන්ද ඇතුලත් බවටත් කාන්තාවන් සඳහා අවශ්‍ය වන ඖෂධ සනීපාරක්ෂාව, ප්‍රජනන සෞඛ්‍ය සහ අනෙකුත් ප්‍රථමික සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අවශ්‍ය වන නිෂ්පාදන තොග අවශ්‍යතරම් නිසි පරිදි ගබඩා කොට පවතින බවටද රජයන් විසින් තහවුරු කල යුතුය .

අවසාන වශයෙන්, මහජන සෞඛ්‍ය පිලිබඳ හදිසි අවශ්‍යතාවයන් පැන නැගුනු අවස්ථාවන්හිදී, ඊට ගෝලීය වශයෙන් දක්වන ඵලදායී ප්‍රතිචාරයන්, සෑම විටම, බලපෑමට ලක්වන කාන්තාවන්ගේ, අයිතීන් සහ අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු බැවින්, කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ තීරණ ගැනීමේදී ද , LGBTI පුද්ගලයන්ද ඇතුළු විවිධ කණ්ඩායම් නියෝජනය කරන කාන්තාවන්ගේ ( යෝග්‍යකර්තා මූලධර්මයන්හි (Yogyakarta Principles)දක්වා ඇති ආකාරයට), ඉදිරිය දැක්ම, අත්දැකීම් සහ අදහස් ද, සැලකිල්ලට ගත යුතුවේ .